මීගමුව අධ්‍යාපන කලාපය

# මීගමුව අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2025

## විද්‍යාව

විභාග අංකය:.........................................

| 8 ශ්‍රේණිය | I හා II පත්‍රය | කාලය පැය 02 |
|---|---|---|

උපදෙස්

- I කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.
- II කොටසේ පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

(01) මෙම ජීවියා අයත්වන ක්ෂුද්‍රජීවී කාණ්ඩය වන්නේ ,



1. බැක්ටීරියා 2. වෛරස් 3. දිලීර 4. ඇල්ගී

(02) පූතිභවනය සිදුවන්නේ පහත සඳහන් කුමන ආහාර කාණ්ඩය මත ද?

1. පාන්,මාළු 2. දොදොල්, කැවුම් 3 .මාළු, රොටී 4. මස්, මාළු

(03) ජීවී ලෝකයේ වැඩිම සත්ත්ව විශේෂ සංඛ්‍යාවක් අයත් වන්නේ කුමන කාණ්ඩයටද ?,

1. ආත්‍රොපෝඩා 2. නිඩාරියා 3. ඇනලීඩා 4. මොලුස්කා

(04) ඉහත රූපයේ දැක්වෙන්නේ දණ්ඩ චුම්බකයක් වටා චුම්බක බල රේඛා පිහිටන ආකාරයයි. එම චුම්බක බල රේඛාවල නිවැරදි දිශාව වන්නේ,




1. S සිට N දක්වා 2.වමේ සිට දකුණට
3. N සිට S දක්වා 4. දකුණේ සිට වමට

(05) පහත දැක්වෙන ද්‍රව්‍ය අතරින් සංයෝගයක් නොවන්නේ,

1. ජලය 2. කොපර්සල්ෆේට්
3. ඇමෝනියා 4. සල්ෆර්

(06) උත්ස්වේදනය අවමකර ගැනීමට ශාකපත්‍ර කටු බවට විකරණය වූ ශාකය වන්නේ

1. අරලිය 2. කස 3. පතොක් 4. නවහන්දි

(07) භූගත කඳන්වල කෘත්‍යයක් වන්නේ,

1. කාලතරණය 2. ප්‍රචාරණය 3. ආහාර සංචිත කිරීම 4. ඉහත සියල්ල

(08) ඝන හා ද්‍රවවලට පමණක් අදාළ වූ ලක්ෂණයක් වන්නේ,

1. ස්ථිර හැඩයක් තිබීමය. 2. නිශ්චිත පරිමාවක් තිබීමය.
3. සම්පීඩනය කිරීමට හැකිවීමය. 4. අංශු නිදහසේ චලනය වීමය.

(09)







ඉහත සංගීත භාණ්ඩවලින් හඬ නිපදවන ආකාරය පිළිවෙළින්,

1. පටල, වායු කඳක් , තත් කම්පනය 2. වායු කඳක්,පටලයක්, තත් කම්පනය
3. තත්, වායු කඳක්, පටලයක් කම්පනය 4. පටලය, තත් , වායු කඳක් කම්පනය

(10) වඩාත් ප්‍රබල චුම්බක තැනීමට භාවිත කරන චුම්බක ද්‍රව්‍යයකි.

1. මෘදු යකඩ 2. ෆෙරයිට් 3. වානේ 4. නිකල්

(11) භෞතික රාශිය හා මිනුම් ඒකකය නිවැරදිව දක්වා ඇති පිළිතුර වන්නේ,
1.විද්‍යුත් ධාරාව -(V) 2. විභව අන්තරය -(A) 3. ප්‍රතිරෝධය - (Ω) 4. විද්‍යුත් ධාරාව -(I)

(12) ස්කන්ධ සංස්ථිති නියමය පිළිබඳව අධ්‍යයනයට ශිෂ්‍යයකු විසින් සිදුකළ ක්‍රියාකාරකමක් පහත රූපසටහනේ දැක්වේ. පරීක්ෂණය සම්බන්ධයෙන් අසත්‍යය ප්‍රකාශය තෝරන්න.




1.ද්‍රාවණ දෙක මිශ්‍ර වූ විට සුදුපාට අවක්ෂේපයක් ලැබේ.
2.පරීක්ෂණයට පෙර හා පසු ස්කන්ධ අසමාන වේ.
3.පරීක්ෂණය සඳහා කේතු ප්ලාස්කුවක් භාවිතා වේ.
4.පරීක්ෂණය සිදුවන්නේ සංවෘත පද්ධතියක් තුළ ය.

(13) නීරෝගී පුද්ගලයෙකුගේ මුත්‍රාවල අඩංගු නොවන සංඝටකය වන්නේ,
1.ලවණ වර්ග 2. යූරියා 3. ජලය 4. ග්ලූකෝස්

(14) "ඇඳුමකට ගිනි ඇවිළුණු විටක දිව යෑමෙන් වැළකිය යුතු ය." මෙහිදී දහනය සඳහා අවශ්‍ය කුමන සාධකය පාලනය කෙරේ ද?
1.දහන පෝෂකය ලැබීම. 2. දාහ්‍ය ද්‍රව්‍ය ජ්වලන උෂ්ණත්වයට පත්වීම.
3.දාහ්‍ය ද්‍රව්‍යයක් පැවතීම. 4. දාහ්‍ය ද්‍රව්‍ය ඉවත්වීම.

(15) නීරෝගී සමක් පවත්වා ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග වන්නේ,
1.පෝෂ්‍යදායී ආහාර ලබාගැනීම. 2. හිරු රශ්මියෙන් සම ආරක්ෂා කර ගැනීම.
3.දුම්පානය නොකිරීම. 4. ඉහත සියල්ලම

(16) රූපයේ දැක්වෙන පරිපථයේ A බල්බය දැල්වීම සඳහා සංවෘත කළයුතු යතුරු (ස්විච්ච) මොනවා ද?
1. $K_1$ හා $K_2$ 2. $K_1$, $K_2$ හා $K_4$
3. යතුරු සියල්ල 4. $K_1$, $K_3$ හා $K_4$




(17) බටනලාවක් වාදනය කිරීමේදී,
1. වායු කඳේ දිග වැඩිවන විට සංඛ්‍යාතය අඩු වේ.
2. වායු කඳේ දිග වැඩිවන විට සංඛ්‍යාතය වැඩිවේ.
3. වායු කඳේ දිග අඩුවන විට සංඛ්‍යාතය අඩුවේ.
4. ඉහත ප්‍රකාශ සියල්ල වැරදිය.

(18) විද්‍යුත් ධාරාවේ ප්‍රකාශ ඵලය භාවිතාවන අවස්ථාවක් වන්නේ ,
1.විද්‍යුත් චුම්භක 2. විද්‍යුත් ලෝහාලේපනය
3.LED වලින් සැදූ පහන් 4. සිසිලන පංකා

(19) A- කොරළ සහිත වියළි සම B - ග්‍රන්ථිමය තුනී තෙත් සම
C - කොරපොතු වලින් ආවරණය වූ දේහය
ඉහත ලක්ෂණ දක්නට ලැබෙන සත්ත්ව කාණ්ඩ පිළිවෙලින්
1.රෙප්ටීලියා, ඇම්ෆිබියා, පිස්කේස් 2. රෙප්ටීලියා, මැමේලියා, පිස්කේස්
3.ඇම්ෆිබියා, මැමේලියා, රෙප්ටිලියා 4. ඇම්ෆිබියා, රෙප්ටිලියා, පිස්කේස්

(20) මේ දිනවල පැතිරෙන ඩෙංගු හා චිකුන්ගුන්යා රෝග වළක්වා ගැනීම සඳහා වඩාත් සුදුසු ක්‍රියාමාර්ගය වන්නේ,
1.රෝගය වැළඳුණු පසු වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම.
2.ප්‍රතිශක්තිකරණ එන්නත් භාවිත කිරීම.
3.පිරිසිදු ආහාර ලබා ගැනීම.
4.මදුරුවන් බෝවන ස්ථාන විනාශ කිරීම.

( ල 2x 20=40 )

## II - කොටස

**පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.**

01 (A) පහත දැක්වෙන්නේ ක්ෂුද්‍ර ජීවී ක්‍රියාකාරීත්වය ආදර්ශනයට විද්‍යාගාරයේ දී සකස් කළ ඇටවුමකි.




I) බෝතලය තුළ ඇති ද්‍රාවණය සැකසීමේදී යීස්ට් වලට අමතරව භාවිත කළ ද්‍රව්‍ය 2ක් ලියන්න. (ල. 02)

II) මෙහි දැකිය හැකි නිරීක්ෂණ 1 ක් ලියන්න. (ල. 01)

III) මෙහිදී සෑදෙන ද්‍රව්‍යයක් නම් කරන්න. (ල. 01)

(B)ප්‍රතිරෝධය හා ධාරාව අතර සම්බන්ධය සෙවීමට ඔබ සිදු කළ ප්‍රායෝගික ක්‍රියාකාරකමට අදාළ රූප සටහන් 02 ක් පහත දැක්වේ.



A




B

I)

| | අවස්ථාව | බල්බයේ දීප්තිය |
|---|---|---|
| a | ස්ථිර ප්‍රතිරෝධකය නැති විට | |
| b | 2 Ω ස්ථිර ප්‍රතිරෝධකය සම්බන්ධ කළ විට | |

(ල. 02)

II)



A



B

ඉහත උපකරණ මොනවාද ?

A. ................................ B. ................................ (ල. 02)

( C ) I.ලෙඩ් නයිට්‍රේට රත් කළ විට පිටවන වායුවේ වර්ණය කුමක්ද ? (ල. 01)

II. යකඩ කුඩු මිශ්‍රිත ග්ලිසරින් තුළ ගිල්වූ දණ්ඩ චුම්බකයක් වටා චුම්බක ක්ෂේත්‍රය අදින්න. (ල. 02)

III. කොපර් සල්ෆේට් ද්‍රාවණය හා සෝඩියම් හයිඩ්‍රොක්සයිඩ් මිශ්‍ර කළ විට සෑදෙන ඵලයේ වර්ණය කුමක්ද? (ල. 01)

( D) වරහන් තුළ දී ඇති වචන සුදුසු පරිදි යොදා පහත සටහනේ හිස්තැන් පුරවන්න. (ල. 04)

පදාර්ථය

සංශුද්ධ ද්‍රව්‍ය a…………………

b……………………... මූලද්‍රව්‍ය

උදා:- c……………………...

ලෝහ f……………………..

උදා:- d……………………... උදා:- g……………………...

e……………………... h……………………...

(මැග්නීසියම්, අලෝහ, සංයෝග, සෝඩියම් ක්ලෝරයිඩ්, මිශ්‍රණ, සල්ෆර්, රසදිය, බ්‍රෝමීන් )

(මුළු ලකුණු 16)

(2) ජලජ පරිසරයකදී දක්නට ලැබුණු සත්ත්වයෙකුට පහත ලක්‍ෂණ තිබුණි.

(A) ජලජ පරිසරයකදී දක්නට ලැබුණු සත්ත්වයෙකුට පහත ලක්‍ෂණ තිබුණි.

(a) ශරීරය අනාකූල හැඩයක් ගනී. (b) දේහය කොරපොතු වලින් ආවරණය වී ඇත.

I) මෙම සත්ත්වයා කුමන කාණ්ඩයට අයත් ද? (ල. 01)

II) මෙම සත්ත්වයාට අනාකූල දේහ හැඩයක් තිබීමේ වාසිය කුමක් ද? (ල. 01)

III) ඉහත සත්ත්ව කාණ්ඩය හැරුණු විට වෙනත් පෘෂ්ඨවංශී සත්ත්ව කාණ්ඩ 2 ක් නම් කරන්න. (ල. 01)

IV) ශ්ලේෂ්මල වලින් තෙත් වූ දේහාවරණයක් සහිත මෘදු දේහ දරණ අපෘෂ්ඨවංශී ජීවී කාණ්ඩය කුමක්ද? (ල. 01)

V) නිඩාරියා කාණ්ඩයේ දේහ ආකාර 2 නම් කරන්න. (ල. 01)

(B) හිස්තැන් පුරවන්න.

I) සජාතීය චුම්බක ධ්‍රැව (a) ------------------ වන අතර, විජාතීය චුම්බක ධ්‍රැව (b) --------------- වේ.

II) ස්ථිර චුම්භක සෑදීම සඳහා (c) ---------------------- හා (d) ----------------------- යන ක්‍රම භාවිතා වේ.

III) චුම්භක බල රඳා පවතින ප්‍රදේශය (e )------------------ නමින් හැඳින්වේ.

IV) පෘථිවියේ චුම්බක උත්තර පිහිටන්නේ සැබෑ උතුරට මදක් (f )----------------------- දෙසිනි.

(1 x 6 = 6) (මුළු ලකුණු 11)

(03)(A) පහත දැක්වෙන්නේ විශේෂ කාර්යයන් ඉටු කරන ශාක මුල් වර්ග කිහිපයකි.



A B C D E

I) ශාක මුල්වල ප්‍රධානතම කාර්යය කුමක් ද? (ල. 01)

II) C රූපයේ ඇති මුල් සහිත වෙනත් ශාකයක් නම් කරන්න. (ල. 01)

III) A,B,C,D, වල ඇති මුල් වර්ග ලියන්න. (ල. 02)

IV) E හි මුල් වල ඇති වැදගත්කම කුමක් ද? (ල. 01)

(B) පහත දැක්වෙන්නේ යකඩ මල බැඳීම සඳහා අවශ්‍ය සාධක පරීක්ෂා කිරීමට අදාළ පරීක්ෂණ ඇටවුමකි.




I) x හා yනම් කරන්න. (ල. 02)

II) ඉහත ඇටවුම යකඩ මල බැඳීම සඳහා කුමන සාධකය අවශ්‍ය දැයි පරීක්ෂා කරයි ද? (ල. 01)

III) දින කිහිපයකින් නිරීක්ෂණය කළ විට නළයෙන් පිටත හා ඇතුළත ඇති ඇණවල දකින නිරීක්ෂණ මොනවා ද? (ල. 02)

IV) යකඩ මල බැඳීමට අවශ්‍ය අනෙක් සාධකය කුමක් ද? (ල. 01)

(මුළු ලකුණු 11)

(04) (A)







I) A හා B හඳුන්වන්න. (ල. 02)

II) A හා B පරිපථයකට සම්බන්ධ කරන ආකාර වෙන වෙනම ලියන්න. (ල. 02)

(B) පහත ප්‍රකාශ නිවැරදි නම් √ ලකුණ ද, වැරදි නම් x ලකුණු ද යොදන්න.

I)සියලුම පදාර්ථ අංශුමය ලෙස සැකසී ඇත. ( )

II)ඝන, ද්‍රව මෙන් ම වායු ද පහසුවෙන් සම්පීඩනය කළ හැකි ය. ( )

III)තඹ භංගුරතාවයෙන් යුතු ලෝහයකි. ( )

IV) ක්ලෝරීන් ද්‍රවමය අලෝහයකි. ( )

V) බෝතල් කළ පානීය ජලය සංශුද්ධ ද්‍රව්‍යයකි. ( )

VI) ඝනත්ව කුප්පිය මගින් සමාන පරිමාවක් නැවත නැවතත් මැනීමේ හැකියාවක් ඇත. ( )

VII) අයිස්වල ද්‍රවාංකය 0 $^0$C ක් වේ. ( ) (ල. 07)

(මුළු ලකුණු - 11)

05.(A) මිනිසාගේ සමායෝජන කාර්යය සිදුකරනු ලබන්නේ ස්නායු පද්ධතිය මගිනි. එහි වර්ගීකරණය පහත පරිදි වේ.

- මානව ස්නායු පද්ධතිය
  - (A)
    - මොළය
      - මස්තිෂ්කය
      - (C)
      - සුෂුම්නා ශීර්ෂකය
    - (B)
  - පර්යන්ත ස්නායු පද්ධතිය
    - (D)
    - සුෂුම්නා ස්නායු

I) මෙහි A,B හා C නම් කරන්න. (ල. 03)

II) පහත කාර්යයන් ඉටුකරනු ලබන මොළයේ කොටස ලියන්න.

a) මතකය, බුද්ධිය වැනි උසස් මානසික ක්‍රියා පාලනය

b) දේහයේ සමතුලිතතාවය පාලනය කිරීම. (ල. 02)

III) මොළය හා සුෂුම්නාව යන අවයව වටා ඒවායේ ආරක්ෂාවට පවතින විශේෂිත පටලය කුමක් ද? (ල. 01)

IV) "ක්‍රිකට් ක්‍රීඩාවේදී පිතිකරු තමාවෙත පැමිණෙන පන්දුවට පහරදීම" මෙම සිද්ධියට අදාළ ප්‍රතිග්‍රාහකය හා කාරකය ලියන්න. (ල. 02)

(B) මිනිස් සිරුරේ තිබෙන විශාලම ඉන්ද්‍රිය සමයි.




I) මෙහි A හා B යන සමේ ප්‍රධාන කොටස් 2 නම් කරන්න. (ල. 02)

II) අපිචර්මයේ ඇති මෙලනින් වර්ණය මගින් ඉටුවන කාර්යය කුමක් ද? (ල. 01)

(මුළු ලකුණු - 11)

(06) (A) රූපයේ දැක්වෙන්නේ A,B,C බල්බ 3 ක් පරිපථයකට සම්බන්ධ කර ඇති ආකාරයයි.




I) මෙම පරිපථයේ A,B,C බල්බ සම්බන්ධ කර ඇති ආකාරය කුමක් ද? (ල. 01)

II) මෙම පරිපථය සම්මත සංකේත භාවිත කර නැවත අඳින්න. (ල. 02)

III) පරිපථය ක්‍රියාත්මක වූ පසු බල්බ රත්විය. මෙහිදී සිදුවන ශක්ති පරිවර්තනය ලියන්න.(ල. 01)

IV) නිවසේ භාවිත කළ හැකි වඩාත් කාර්යක්ෂම බල්බ වර්ගයක් නම් කරන්න. (ල. 02)

(B ) පදාර්ථයේ අසන්තතික ස්වභාවය හඳුනා ගැනීම යටතේ සිදුකරන ලද පහත පරීක්ෂණය සලකන්න.



I) මෙහිද සැදෙන දුඹුරු පැහැති වායුව කුමක් ද? (ල. 01)

II) මෙමගින් ලබාගත හැකි නිගමනය කුමක් ද? (ල. 02)

III) වායුවක අංශු සැකසීම ඇඳ දක්වන්න. (ල. 01)

IV) ඉහත අංශු සැකැස්මට අනුව වායුවක ලක්ෂණයක් ලියන්න. (ල. 01)

(මුළු ලකුණු - 11)

07. A කොටසට ගැළපෙන පිළිතුර B කොටසින් තෝරා ඊට අදාළ අක්ෂරය හිස්තැන මත ලියන්න.

| A | B |
|---|---|
| I. සයිලෆෝනයේ හඬ නිපදවෙන්නේ ___________ | a. දිග අඩු කළ යුතුය |
| II. සංඛ්‍යාතය මනිනු ලබන ඒකකය වනුයේ, ___________ | b. අඩු වේ. |
| III. ධ්වනිය ජනනය වන්නේ, ___________ | c. සංගීත චිකිත්සාව |
| IV. කම්පන පියවි ඇසින් නිරීක්ෂණය කළ නොහැකි අවස්ථාවකි ___________ | d. හැකිය |
| V. ධ්වනිය සම්ප්‍රේෂණයට ___________ අවශ්‍ය වේ. | e. කම්පනය මඟිනි |
| VI. සංගීතය යොදා ගනිමින් කරනු ලබන ප්‍රතිකර්ම ක්‍රමයයි. ___________ | f. වැඩිවේ. |
| VII. සරසුල දිගින් වැඩි වන විට සංඛ්‍යාතය ___________ | g. තහඩු කම්පනයෙන්ය |
| VIII. වයලීනයක කම්බියේ ඝනකම අඩු වන විට සංඛ්‍යාතය ___________ | h. ඉහළ සංඛ්‍යාතයකින් කම්පනය වන සරසුල |
| IX. පටල කම්පනයෙන් හඬ නිපදවිය හැකි උපකරණයකි ___________ | i. උඩැක්කිය |
| X. ගොක්කොළ නළාවක ශබ්දය හොඳින් ශ්‍රවණයට ___________ | j. හර්ට්ස් |
| XI. සංගීත භාණ්ඩ වල කම්පනය වන කොටස් වල දිග සීරුමාරු කිරීමෙන් සංඛ්‍යාතය වෙනස් කළ ___________ | k. මාධ්‍යයක් |

(මුළු ලකුණු - 11)